---

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 15 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ශේෂ පිරික්සුමෙහි කර්මාන්ත ණයගැතියෝ ලෙස රු.27,906,616 ක හර ශේෂයක් හා බැර ශේෂයක් දක්වා තිබීමෙන් වර්ෂයට අදාල ණයගැති ශේෂය තථ්‍ය ලෙස දක්වා නොතිබුණි.

(ආ). ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වැය අදාල අයශීර්ෂය හා වැය විෂයය යටතේ ගිණුම් ගත නොකර තැන්පත් ගිණුම මගින් සටහන් කිරීම හේතුවෙන් රු.52,285,095 ක ප්‍රාග්ධන ලැබීම් හා වියදම් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි.

(ඇ). ප්‍රාග්ධන වැය ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ රු.17,393,876 ක ප්‍රමාණය තුල ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු යටතේ ගිණුම් ගත විය යුතු රු.1,426,285 ක් ඇතුලත්ව තිබුණි.

(ඈ). මූල්‍ය ප්‍රකාශන වල රු.25,562,523 ක කර්මාන්ත ණය හිමි ශේෂයක් දක්වා තිබුණද, එකී වටිනාකමද වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබූ අතරම එකී මුදල් ණයගැතියන් යටතේද දක්වා නොතිබුණි.

(ඉ). වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ රු.28,227,887 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු.29,470,376 ක් ලෙස දැකවීමෙන් වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූරණ රු.1,242,489 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම වැටුප් ප්‍රතිපූර්ණ ලෙස රු.111,500 ක් ලැබිය යුතුව පැවතියද එය ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ). මුද්දර ගාස්තු ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශන වලට රු.680,324 ක් ගෙන තිබුනද තත්‍ය මුද්දර ගාස්තු ආදායම රු.9,788,059 ක් වූයෙන් මුද්දර ගාස්තු ආදායම රු.9,107,735 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම 2010 වර්ෂයට අදාලව රු.5,000,000 ක් හා 2012 වර්ෂයට අදාල රු.9,788,059 ක් ලෙස රු.14,788,059 ක හිඟ මුද්දර ගාස්තු ආදායමක් ලැබිය යුතුව පැවතියද එක ප්‍රමාණයන් ආදායම් ණයගැතියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(උ) උසාවි දඩ ආදායම ලෙස රු.1,439,735 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද, තත්‍ය ප්‍රමාණය රු.2,273,080 ක් වීමෙන් උසාවි දඩ ආදායම රු.833,345 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ලැබිය යුතු රු.923,689 ක උසාවි දඩ ආදායම්, ආදායම් ණයගැතියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ). සභාව විසින ආරම්භ කර තිබූ කුට්ටි ගල් ව්‍යාපෘතිය සඳහා වර්ෂය තුල ලැබී තිබූ රු.2,590,624 ක් ආදායම පුනරාවර්ථන අයශීර්ෂයට ගිණුම් ගත කර තිබූ අතර රු.2,493,499 ක් වූ වියදම 309 ප්‍රාග්ධන වැය යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එමෙන්ම කුට්ටිගල් ව්‍යාපෘතියේ තොග ලේඛන අනුව පැවත රු.855,667 ක අතැති තොග ශේෂය මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.31,507,320 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.8,367,024 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,938,311 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය අවසානයට පැවති සේවක ණය ශේෂය වූ රු.8,696,633 තුල සේවය අතහැර ගිය සේවකයින් 10 දෙනෙකුට අදාල රු.218,729 ක අයකර ගැනීමට නොහැකි ශේෂයක් පැවතුණි. එමෙන්ම ගිණුම් විෂයයන් 5 ක් යටතේ රු.172,241 ක් වූ ශේෂය වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින අතර ඒවා පැන නැගුණු ආකාරය හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ආ). වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ලි බඩු හා සවිකිරීම් ගිණුමෙන් රු.1,301,680 ක ශේෂයක් සමීක්ෂණ මණ්ඩල තීරණ අනුව ජනල් සටහන් මගින් අදාල ගිණුමෙන් ඉවත් කර තිබූ අතර එකී ඉවත් කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉකුත් වර්ෂ වල සිට පැවති ගිණුම් ශේෂයන් පැන නැගී ආකාරය සොයා බැලීමකින් හා අනුමැතියකින් තොරව ජර්නල් සටහන් මගින් සමුච්චිත අරමුදලට අවස්ථා 10 කදී රු.46,730,587 ක් හර කර හා අවස්ථා 13 ක රු.22,364,028 ක් බැර කර කපාහැර තිබුණි.

(ඈ) අත්තිකාරම් ශේෂය තුල වූ හදිසි අනතුරු වන්දියක් සඳහා ගෙවූ රු.85,882 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණ වියයුතු වුවත් මෙතෙක් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

2.3 <u>බැංකු ගිණුම්</u>

(අ). පොදු ජංගම බැංකු ගිණුමෙහි 2011 දෙසැම්බර් මාසයට අදාල හඳුනාගත නොහැකි ගණුදෙනු සම්බන්ධයෙන් ජනල් සටහන් මගින් පොදු මුදල් ගිණුම රු.3,150,144 ක් හර කර සමුච්චිත අරමුදල රු.3,150,144 ක් හඳුනා ගැනීමකින් තොරව බැර කර තිබුණි. එමෙන්ම මෙකී ගිණුමට අදාලව අයිරා ශේෂ පැන නැගී තිබූ අතර වර්ෂය අවසානයට බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව එකී අයිරා ශේෂය රු.1,075,666 ක් විය. ලදුපත් නොමැති ලැබීම් ලෙස හඳුනා නොගත් රු.91,900 ක් ද බැංකු සැසඳුමෙහි දක්වා තිබුණි.

(ආ). කර්මාන්ත ජංගම බැංකු ගිණුමෙහ 2012 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම අනුව පොදු ගිණුමට එකතු කිරීම් යටතේ රු.613,583 ක්ද ලැබිය යුතු මුදල් ලෙස රු.195,000 ක්ද කර්මාන්ත ගිණුමට වැඩියෙන් බැර ලෙස රු.2,611,982 ක්ද හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඇ). සේවක ණය ජංගම බැංකු ගිණුමට අදාලව වර්ෂ අවසානයට බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව පොදු බැංකු ගිණුමට සටහන් වී ඇති ගිණුමට බැර නොවූ චෙක්පත් ලෙස රු.12,161 ක් හා පොදු ගිණුමට බැර වූ මුදල් ලෙස 2012 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව රු.27,709 ක් නිරවුල් නොකර පැවතුණි.

2.4 <u>ආදායම් පරිපාලනය</u>

2.4.1 <u>ඇස්තමේන්තගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 3,956 | 4,219 | 5,202 |
| (ii) | බදුකුලී | 3,653 | 5,278 | 2,089 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,631 | 1,564 | - |
| (iv) | වෙනත් ආදායම් | 66,560 | 41,052 | 1,563 |

---

2.4.2 <u>වරිපනම් බදු</u>

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.5,202,721 ක් වූ අතර, මෙම හිඟබදු අයකර ගැනිම සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 32 සිට 42 දක්වා වූ රීතින් අනුව කටයුතු කර නොතිබූ අතර අවසන් නිවේදන නිකුත් කිරීම පමණක් සිදුකර තිබුණි. සඳුකල නියදි පරීක්ෂාව අනුව අවස්ථා 28 කට අදාලව දිගුකාලීන හිඟ බදු වටිනාකම රු.147,034 ක් විය.

2.4.3 <u>කඩ කුලී</u>

(අ). දීර්ඝ කාලීන බදුදීම් යටතේ අවස්ථා 08 කට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට රු.65,124 ක හිඟ බදු පැවති අතර, කඩ කාමර 12 කට අදාලව දීර්ඝ කාලීනව රු.145,527 ක හිඟ පවතින අතර මාසික බිල්කිරීම්ද නවතා තිබුණි. එහෙත් මෙම කඩ සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පවත්වාගෙන යනු ලබන අතර, එලෙස බිල්කිරීම් අත්හිටුවීමට හේතු හා නීතිමගින් හිඟ මුදල් අයකර නොගැනීමට හේතු අනාවරණය නොවුණි.

(ආ). 2011 වර්ෂයේදී කඩා ඉවත් කර තිබූ කඩ කාමර 14 කින් රු.15,693 ක හිඟ කුලියක් අයවීමට තිබූ අතර, නගරයේ පැවති සපතේරු කුටි 3 ක් එකී කාලය තුලම ඉවත් කර තිබූ අතර එදිනට වූ හිඟ මුදල ලෙස පැවති රු.69,780 ක් අයකර ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. ගොඩවෙල සතිපොල පදික කඩ 8 න් 4 ක දිගුකාලීනව රු.46,655 ක හිඟ කලියක් අයකරගෙන නොතිබුණි.

(ඇ). පොතුහැර උපකාර්යාලයට අයත් පොදු වෙළඳපල කඩ කාමර 13 න් කඩ කාමර 12 ක් වර්ෂ 5 ක පමණ කාලයක සිට වසා තිබූ අතර, එකී කඩ කාමර වලින් රු.9,960 ක් කුලියක් අයවීමටද තිබුණි. මෙම කඩ කාමර නවීකරණය කළයුතු තත්වයේ පැවති අතර සභාව එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකිරීමෙන් එම කඩ කුලියට දීමට නොහැකි වී තිබුණි. පොතුහැර උපකාර්යාලයට අයත් උහුමීය වෙළඳ කඩ 5 කින් දිගුකාලීනව පැවත එන රු.181,218 ක හිඟ කුලියක් සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට තිබුණි.

2.4.4 <u>බදුකුලී</u>

(අ). වාර්ෂික බදුදීම් යටතේ 2007-2011 කාල පරිච්ජේදය සඳහා අවස්ථා 23 කට අදාලව රු.1,891,973 ක හිඟ කුලියක් පැවති අතර, ඉන් ඇතැම් හිඟ වෙනුවෙන් නඩු පවරා ඇති බව සඳහන් වුවද, නඩු ලේඛන හා ගොනු යාවත්කාලීන නොවීම හේතුවෙන් එකී නඩු වල ප්‍රගතියද හඳුනාගත නොහැකි විය.

(ආ). සභාව සතු බයිසිකල් සුරැකුම් ස්ථානයක් 2012 වර්ෂයට රු.109,395 කට බදු දී තිබුණු අතර බදුකරු විසින් 2012 ජනවාරි සිට මැයි දක්වා මාස 5 ක් පවත්වාගෙන ගොස් අදාල කාර්යයෙන් ඉවත්ව තිබූ අතර, බදුකරුගෙන් අයවිය යුතු රු. 56250 ක මුදලෙන් ඇප මුදල වූ රු.43,758 ක ප්‍රමාණය

හිලව් කල පසු තවදුරටත් රු.12,492 ක හිඟයක් පැවති අතර 2012 අගෝස්තු මාසයෙන් පසුව මෙම සුරැකුම් මධ්‍යස්ථානය සභාව විසින් පවත්වා ගෙන ගොස් තිබුණි.

(ඇ) ගොඩවෙල සතිපොල ආපන ශාලාව සම්බන්ධයෙන් අවසන් වරට 2008 ජනවාරි 01 සිට 2008 දෙසැම්බර් 31 යන කාලයට මාසික කුලිය රු.1,250 කට ගිවිසුම් ගතව පැවති අතර මෙම ගොඩනැගිල්ල සඳහා රු.261,817 ක අළුත්වැඩියා වියදමක් දරා තිබුණි. 2009 වර්ෂය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගිවිසුමකට එළඹ නොතිබුණි. විධිමත් ගිවිසුමක් හා කුලි ගෙවීමක් නොමැතිව බදුකරු ආපන ශාලාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් 2008 වර්ෂයේ නීතිමය ක්‍රියා මාර්ග ගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම තීන්දුවක් ලැබී නොතිබුණි.

(ඇ). බස්නැවතුම්පල ආපන ශාලාව බදු කුලී වශයෙන් 2007 සිට 2012 වර්ෂය අවසානය දක්වා රු.499,558 ක හිඟ මුදලක් අයවිය යුතුව තිබුණ ද හිඟ මුදල් අයකර ගැනිමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4.5 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බිල්කිරීම් වලට අදාලව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ රීති 59 හා 67 දක්වා ඇති පරිදි වූ සමීක්ෂණ පවත්වා නොතිබුණි.

2.4.6 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 16 ක් ස්ථාපිත කර ඇති බව හඳුනාගෙන 2010 සිට 2012 දක්වා කුළුණු 2 ක් වෙනුවෙන් රු.400,000 ක පෙරසැරි ගාස්තු අයකර තිබූ අතර වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු අයකරගෙන නොතිබුණි.

2.4.7 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ වාහන නැවැත්වීමට අදාල අතුරු ව්‍යවස්ථා නොතිබූ අතර ත්‍රීරෝද රථ නැවැත්වීමට අදාල වාර්ෂික හෝ කාලානුරූපීව සමීක්ෂණයක් සිදුකර සභා බල ප්‍රදේශය තුල පවතින ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමක් කර නොතිබුණි.

2.4.8 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ / මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය ප්‍රකාරව, සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කළයුතු වුවද, සභාව විසින් එසේ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

සභාවට අදාලව අනුමත සේවක සංඛ්‍යාව 129 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 100 ක් වූ අතර පුරප්පාඩු 29 ක් හා අතිරික්ත 01 ක් පැවති අතර, එතුල වූ ලේකම් තනතුර හා පුස්තකාලාධිපති තනතුරු 04 න් 01 ක් වැඩ ආවරණය කරමින් පැවතිණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයේදී අනියම් හා ආදේශක පදනම මත 62 කු බඳවාගෙන සභා අරමුදලින් වැටුප් ගෙවා තිබුණි.

## 2.7 සභාවට එරෙහිව හෝ සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු

කඩකුලී සම්බන්ධව පවතින හිඟ අයකිරීමට නීති මගින් කටයුතු කර තිබූ බවට කඩකුලී ලේඛනයේ සඳහන් කර තිබූනද ඒ වෙනුවෙන් පැවැත්වූ ලිපිගොනු හෝ නඩු ලේඛනයක් යාවත්කාලීනව සභාව පවත්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල නඩු 3 ක් වෙනුවෙන් නීති ගාස්තු ලෙස රු.62,500 ක් වැයකර තිබුණි. එමෙන්ම රු.596,957 ක හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 2007 හා 2011 වර්ෂ වලදී පවරා තිබූ නඩු 5 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සමතයකට පත්ව නොතිබුණි.

## 2.8 කොන්ත්‍රාත් පරිපාලනය

මුළු පිරිවැය රු.597,879 ක් මත ඉදිකර තිබූ ඝෝගාතකාගාරයේ ඉදිකිරීම් කිරීමේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් ලබාගෙන නොතිබුණි. ඝෝගාතකාගාරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා තවදුරටත් සම්පූර්ණ කළයුතු කාර්යයන් පවතින බව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ 2011 ජුලි 21 දිනැති ලිපිය මගින් දන්වා තිබුණ ද එකී කාර්යයන් නිමවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඝෝගාතකාගාරය අදාල කාර්ය සඳහා යොදවාගෙන නොතිබුණි.

## 2.9 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). ආදායම් විෂයයන් 2 ක් යටතේ රු.31,935,000 ක ආදායමක් උපයා ගැනිමට අපේක්ෂා කළද ඉන් උපයාගෙන පැවතියේ 15% ක් ලෙස රු.4,894,000 ක් පමණි.

(ආ). සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.7,811,922 ක්ව

තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු.15,610 බැගින් එකී අරමුදල විසින් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ඈ). සභාව සතු පොදු වෙළඳපල කඩ සඳහා වෙනම ජල මනු සවිකිරීම සිදුකර නොතිබූ අතර පොදු වෙළඳපලෙහි පොදු ජල සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.141,520 ක් සභාව වැයකර තිබුණි. තවද පොදු වෙළඳපල මුරකුටියේ විදුලි ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.37,744 ක් වැය කර තිබූ අතර එවැනි මුදලක් මුරකුටිය වෙනුවෙන් වැයවීමට හේතු වූ කරුණු ද තහවුරු නොවුණි.

2.10 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශයේ එකතුවන කසල බැහැර කිරීම සඳහා රු.9,709,224 ක් වැයකර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ අතර එහි සමාලෝචිත වර්ෂය තුල කොම්පෝස්ට් අලෙවිය හා අපද්‍රව්‍ය අලවියෙන් රු.50,788 ක ආදායමක් උපයා තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් වියදම රු.1,275,761 ක් විය.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය